(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 14(2).]

# පාර්ලිමේන්තුවේ අංක 14 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 මැයි මස 22 වැනි සිකුරාදා**

---

## 2015 ජූනි මස 09 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 25 වැනි වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.05.19 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතුය.

(අංක 974 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ 2014.10.23 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ගිණුම් වාර්තාව අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.11.13 දින සලකා බලන ලදී.)

*

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.09.23 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ගිණුම් වාර්තාව අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.11.13 දින සලකා බලන ලදී.)

*

නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2012,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය යටතේ 2014.09.24 දින ඉදිරිපත් කරන ලද, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ

ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.10.10 දින සලකා බලන ලදී.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## 2015 ජූනි මස 11 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4981/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිනුවන්ගොඩ ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පිහිටි සීමාසහිත වෙහිකල්ස් ලංකා පුද්ගලික සමාගම ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර තිබේද;

(ii) එසේ නම්, එම සමාගම ලියාපදිංචි කළ දිනය කවරේද;

(iii) එම සමාගමේ හිමිකරු / හිමිකරුවෝ කවුරුන්ද;

(iv) එම සමාගම ලියාපදිංචි කිරීමේදී එම ව්‍යාපාරයේ ස්වභාවය දක්වා ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5131/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව ක්‍රියාත්මක කළ කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල මැතිවරණ කොට්ඨාසයේ, වැල්ලව, තල්විට වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට අදාළ නාම පුවරුව එම වැව අසල ස්ථාපිත කර ඇතත්, මෙතෙක් එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) එම වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5358/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2014 ජූනි මස 22 වැනි දින පවත්වනු ලැබූ මත්තල ගුවන් තොටුපොළේ හා මාගම්පුර වරායේ තෙල් ගබඩා සංකීර්ණය විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන්,

(i) දැරූ සමස්ත වියදම;

(ii) ශබ්ද විකාශන උපකරණ ලබා ගැනීමට වැය කළ මුළු මුදල;

(iii) ජංගම වැසිකිළි පහසුකම් සැපයීම සඳහා වැය කළ මුළු මුදල;

(iv) භාවිතා කළ ජංගම වැසිකිළි සඳහා ජලය සැපයීම වෙනුවෙන් ගෙවා ඇති මුදල;

(v) සිදු කළ සංග්‍රහ වෙනුවෙන් වැය කළ මුදල;

(vi) ශ්‍රව්‍ය-දෘශ්‍ය උපකරණ පද්ධතියක් සපයා ගැනීමට වැය කළ මුළු මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත උත්සවය වෙනුවෙන්,

(i) ශබ්ද විකාශන යන්ත්‍ර සැපයූ ආයතන කවරේද;

(ii) ජංගම වැසිකිළි පහසුකම් සැපයූ ආයතනයේ නම හා ලිපිනය කවරේද;

(iii) සංග්‍රහ කටයුතුවලට අදාළ සැපයීම් සිදු කළ ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5917/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනාධිපතිවරණයේ තැපැල් ඡන්දය පැවති 2014.12.23 දින ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවකයෙකුට දේශපාලනඥයකු හා ඔහුගේ ආරක්ෂකයන් විසින් පහරදීමක් සිදුකර ඇති බවත්;

(ii) එම පහරදීම හේතුවෙන් පහර කෑමට ලක්වූ අය රෝහල් ගතව සිටි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු ද වන සඳුන් හේමන්ත නමැති එම සේවකයාට දේශපාලන හේතු මත සිදු කරනු ලැබූ එම පහරදීම පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iii) චෝදනා ලබා ඇති පුද්ගලයන්ගේ නම් සහ අනෙකුත් තොරතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6015/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය මගින් මාතර දිස්ත්‍රික්කය සඳහා පත්කර ඇති ලොතරැයි අලෙවි නියෝජිතයන් සංඛ්‍යාව සහ අලෙවි සහකාරවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් ලොතරැයි පතක් විකිණීමේදී ලොතරැයි අලෙවි සහායකවරයෙකුට ගෙවනු ලබන මුදල කොපමණද යන්න නිශ්චය කර තිබේද;

(iii) ලොතරැයි අලෙවි සහායකවරයෙකුට ජීවිත රක්ෂණයක් ලබා දී තිබේද;

(iv) නොඑසේ නම්, එවැනි රක්ෂණ ක්‍රමයක් ඇති කිරීමට යෝජනා කර තිබේද;

(v) ලොතරැයි අලෙවිය සඳහා සැලකිය යුතු සේවයක් කරනු ලබන අලෙවි සහායකයින්ට සහන මිලකට යතුරුපැදි ලබාදීමට හැකියාවක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6047/'15

ගරු රාජිව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 වසරට පෙර කාල සීමාව තුළ සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියාමාලව පිළිබඳ සොයා බැලීම සඳහා දිවංගත ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු වූ උදලාගම මහතා යටතේ කොමිසමක් පත් කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම කොමිසමේ වාර්තාව පිළිගන්වන ලද්දේ කවදාද;

(ii) එම වාර්තාව ප්‍රසිද්ධියට පත් නොකිරීමට හේතුව කවරේද;

(iii) එම වාර්තාවේ අන්තර්ගතයන් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නේද;

(iv) එම වාර්තාවේ සඳහන් සොයාගැනීම්වලට අනුව අවශ්‍ය නම් නීතිමය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6056/'15

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය ජනවාරි 08 වැනි දිනෙන් පසු ඇති වූ නව රජය යටතේ අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශය තුළ දැඩි ලෙස දේශපාලන පළිගැනීම් සිදු වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) සම්මුඛ පරීක්ෂණ පවත්වා අවශ්‍ය සුදුසුකම් මත බඳවාගෙන සිටි ජී. ප්‍රියදර්ශන, ප්‍රධාන කළමණාකාර, ලංකා ගමනාගමන මණ්ඩලය මධ්‍යම කාර්යාලය, මහනුවර, බී. ඒ. වීරකෝන්, ප්‍රධාන ප්‍රාදේශීය ධාවන කළමනාකාර, ප්‍රධාන කාර්යාලය මහයියාව, අසංක දෙල්ලංග, ඩිපෝ කළමනාකාර, මහනුවර දකුණ ඩිපෝව, එල්. පී. උඩවෙල, ඩිපෝ කළමනාකාර, උඩුදුම්බර ඩිපෝව, ඒ. එන්. සේනානායක, ඩිපෝ කළමනාකාර, මහනුවර උතුර ඩිපෝව, එච්. බී. අමරකෝන්, දිසා ලේකම්, මහනුවර උතුර ඩිපෝව සහ කේ. එල්. කරුණාරත්න, ධාවන කළමනාකාර, මහනුවර උතුර ඩිපෝව යන නිලධාරීන් ඉවත් කර ඔවුන්ගේ වැඩ ආවරණය කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ නොපවත්වා බඳවාගෙන ඇති අයගේ නම් සහ ඔවුන්ගේ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6061/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති යාපනය ඒලාලෙයි ශ්‍රී මුරුගන් විද්‍යාලයේ ජල ටැංකිවලට වස මිශ්‍රවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසලේ ජල ටැංකිවලට වස මිශ්‍රවීම පිළිබඳව සොයා බැලීමට පරීක්ෂණ කමිටුවක් පත් කරනු ලැබුවේද;

(ii) එම සිද්ධියට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඊට අදාළ චූදිතයන් හඳුනාගෙන තිබේද;

(iv) ඔවුන් අත්අඩංගුවට ගනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6069/'15

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල් වරයා කවුරුන්ද;

(ii) එම තැනැත්තා වෙනත් ආයතනයක නිත්‍ය තනතුරක් දරන්නේද;

(iii) එසේ නම්, එම දෙවන තනතුර ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදය සහ එයට අදාළ චක්‍රලේඛවල සඳහන් පරිපාටිය අනුගමනය කොට ලබාගෙන තිබේද;

(iv) මීට පෙර එම තැනැත්තා රජයේ වෙනත් ආයතනවල උපදේශක හෝ වෙනත් තනතුරු දරා තිබේද;

(v) එසේ නම්, දරා ඇති එම තනතුරු කවරේද;

(vi) එම තැනැත්තා ආයතන සංග්‍රහයේ XII - XXX පරිච්ඡේද සහ ඒවාට අදාළ චක්‍රලේඛවල සඳහන් පරිපාටිය අනුගමනය කොට එම තනතුරු ලබාගෙන තිබේද;

(vii) එම තනතුරු සඳහා වැටුප්, දීමනා හෝ වෙනත් වරප්‍රසාද ලබාගෙන තිබේද;

(viii) එම වැටුප්, දීමනා හෝ වරප්‍රසාද ලබාගත් වර්ෂයන් හා මාස කවරේද;

(ix) එම දීමනා හෝ වැටුප්වල විස්තර මාසිකව හෝ වාර්ෂිකව ඉදිරිපත් කරන්නේද;

(x) එම තැනැත්තා වෙනත් රාජ්‍ය ආයතනවලින් විදේශ සංචාර හෝ වෙනත් වරප්‍රසාද ලබාගෙන තිබේද;

(xi) එසේ නම්, ඒවා කවරේද;

(xii) ආයතන සංග්‍රහයේ කුමන වගන්තිය යටතේ එම වරප්‍රසාද ලබාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6071/'15

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000 සිට 2010 දක්වා කාලසීමාව තුළ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සිය නීති උපදේශකයින් වශයෙන් යොදවා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් කවුරුන්ද;

(iii) ඔවුන් උපදේශකයින් ලෙස කටයුතු කර ඇති කාල සීමාවන් කවරේද;

(iv) එලෙස නීති උපදේශකයින් ලෙස කටයුතු කර ඇති නිලධාරීන්ට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් වැටුප් හෝ දීමනා ගෙවා තිබේද;

(v) එසේ නම්, එම එක් එක් නිලධාරියාට ගෙවා ඇති දීමනාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(ii) හි සඳහන් නිලධාරින් අ(iii) සඳහන් කාලය තුළ දී නීතිපති දෙපාර්තමේන්තුවෙන් වැටුප් ලබාගෙන තිබේද;

(ii) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් එම නීති උපදේශකයින්ට ගෙවනු ලැබූ මුදලට අමතරව, නීති උපදෙස් ලබා දීම සම්බන්ධයෙන් වෙනත් මුදලක් නීතිපති දෙපාර්තමේන්තුවට ගෙවා තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6072/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දිවයින පුරා පිහිටි ග්‍රාමීය පාසල්වල ගුරු පුරප්පාඩු ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගුරු පුරප්පාඩු පිරවීම සඳහා කරනු ලබන යෝජනා කවරේද;

(ii) එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6090/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂය තුළ කොටස් මාරු කිරීමේ, පැවරීමේ හෝ නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාළ වෙළඳපොළ අගය කොපමණද;

(ii) ඒ අනුව අය කරනු ලැබූ මුළු මුද්දර ගාස්තුව කොපමණද;

(iii) මුද්දර ගාස්තු අයකරනු ලබන පදනම හෝ නිර්නායකයන් කවරේද;

(iv) එකී ක්‍රියාවලිය සඳහා හෝ එම ක්‍රියාවලිය නිසා එකතුවන අගය මත වෙනත් කිසියම් බද්දක් හෝ බදු අය කරනු ලබන්නේද;

(v) එසේ නම්, 2014 වර්ෂය සඳහා එසේ අයකරන ලද බදු වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4983/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සම සෞඛ්‍ය උපාධි පාඨමාලාවට අදාළව එවකට අගවිනිසුරු සරත් නන්ද සිල්වා මහතා ඇතුළු ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින් 2009.06.01 දින ලබා දී ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවට අනුව, පළමු කන්ඩායම් තුනෙන් පසු ඉදිරි වසර සඳහා පේරාදෙණිය සම සෞඛ්‍ය පීඨයට කණ්ඩායම් බඳවා ගැනීම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඇතුළු අදාළ සියලු පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව සිදු කළ යුතුව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත තීන්දුවේදී අදාළ සියලු පාර්ශ්වයන් ලෙස හඳුන්වා දී ඇති පාර්ශ්වයන් කවරේද;

(ii) මේ වන විට එම පාර්ශ්වයන් සමඟ සාකච්ඡා පවත්වා තිබේද;

(iii) එසේ නම්, එම සාකච්ඡා පැවැත් වූ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සාකච්ඡාවලදී ගනු ලැබූ තීරණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5987/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොඩ දමන වැලි අලෙවි කිරීම සඳහා කොළඹට රැගෙන යෑම ගැටලුවක් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කන්තලේ සිට කොළඹට වැලි ප්‍රවාහනය කිරීමට ඇති පහසුම මෙන්ම ප්‍රධානතම මාර්ගය වන ත්‍රිකුණාමලය-කොළඹ මාර්ගයේ හබරණ ප්‍රදේශය පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත්වීම වැලි ප්‍රවාහන බලපත්‍ර ලබා දීමට ගැටලුවක් වීමට හේතු වී ඇති ආකාරය කවරේද;

(ii) ඉහත තත්ත්වය යටතේ කන්තලේ ප්‍රදේශයෙන් ලබා ගන්නා වැලි අනුරාධපුරය හරහා කොළඹට ගෙන යෑම නිසා සිදුවන වැලි මිළ ඉහළ යෑම වළක්වාලීමට වැලි ප්‍රවාහන බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් ලබා දෙන සහනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6073/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී යාපහුව ආසනය තුළ විදුලි යෝජනා ක්‍රම 08 ක සහ කෙටිදුර විදුලි දිගු 290 ක වැඩ අවසන් කර ඇති නමුත් මේ දක්වා ඒවාට විදුලි කැවීම් කටයුතු ප්‍රමාද කිරීමට හේතු කවරේද;

(ii) එකී ව්‍යාපෘති සඳහා විදුලිය කැවීමට කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 ජූනි මස 12 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4984/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශීය සමාගම් විසින් නෙළා ගන්නා බවත්;

(ii) විදේශිකයන්ගේ ධීවර යාත්‍රා සඳහා ශ්‍රී ලංකා මුහුදු කලාපය තොටුපළක් ලෙස භාවිතා කරන බවත්;

(iii) ශ්‍රී ලංකාවට මාළු ආනයනයකර ප්‍රතිඅපනයනය කරන බවත්;

(iv) ශීත කළ මාළු ශ්‍රී ලංකාවට ආනයනය කරන බවත්;

(v) ඉහත (i) සිට (iv) දක්වා සඳහන් හේතු ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයට විශාල බලපෑමක් ඇතිකර තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) සිට (අ) (iv) දක්වා සඳහන් වන එක් එක් ගැටලුකාරී තත්ත්ව විසඳීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් කරුණට අදාළව ගෙන ඇති පියවර කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5248/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල ඩී. බී. වෙලගෙදර මධ්‍ය මහා විද්‍යාලයේ මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරයක් ඉදි කර තිබේද;

(ii) එම විද්‍යාගාරයට අවශ්‍ය යටිතල පහසුකම් සපයා තිබේද;

(iii) එම විද්‍යාගාරය විවෘත කරන දිනය කවරේද;

(iv) එම විද්‍යාලය ද්විතීයික පාසලක් බවට පත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5988/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා ධීවර සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ ගණකාධිකාරිවරයෙකු වන ආර්. කේ. සමන්ත ලාල් මහතා හා පිරිස් කළමණාකාර එදිරිසිංහ මහතා සේවය අවසන් කර යමින් සිටියදී එම ආයතනයේම සේවකයෙකුගේ පෙළඹවීම මත 2015.02.25 දින පහරදීමකට ලක්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පහරදීමේ සිද්ධිය මෙහෙයවා ඇති ධීවර සංස්ථා සේවකයා හඳුනාගෙන තිබේ නම්, ඔහු කවුරුන්ද;

(ii) ඔහුට එරෙහිව ආයතනික වශයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iv) විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(v) පහරදීමේ සිද්ධිය මෙහෙයවා ඇති බවට හඳුනාගෙන ඇති පුද්ගලයාට එරෙහිව ක්‍රියාමාර්ග නොගන්නේ ද;

(vi) නැවත එවැනි සිදුවීම් සිදු නොවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6017/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.12.24 දින කඹුරුපිටිය, නාරංදෙනිය ජාතික පාසල් ක්‍රීඩාංගණයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ප්‍රචාරක රැස්වීමක් පවත්වනු ලැබුවේද;

(ii) ඒ සඳහා විදුහල්පතිගේ හෝ ජාතික පාසල් අධ්‍යක්ෂගේ අවසරය ලබාගෙන තිබේද;

(iii) මතු සඳහන් දිනයේ පැවති ජනාධිපති අපේක්ෂක ප්‍රචාරක රැස්වීම වෙනුවෙන් 2014.12.16 දින ඉහත සඳහන් පාසලේ තාප්පය කඩා ඉවත් කළේද;

(iv) පාසල් කමිටුවේ ඉල්ලීමක් මත විදුහල්පතිවරයා විසින් එම තාප්පය කඩා ඉවත් නොකරන ලෙස පොලිසියට පැමිණිලි කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තාප්පය කඩා ඉවත් කිරීම නිසා ක්‍රීඩා පිටියට සහ පාසලේ දරුවන්ගේ ආරක්ෂාවට හානිකර තත්ත්වයක් ඇති වී තිබේද;

(ii) දේශපාලනමය අවශ්‍යතාවයක් මත කඩා ඉවත්කරන ලද තාප්පයට දරන ලද වියදම කොපමණද;

(iii) එම තාප්පය පාසල් දරුවන්ගේ මව්පිය මූල්‍ය ආධාර යටතේ ඉදිකරනු ලැබුවක්ද;

(iv) කඩා දමන ලද තාප්පය යථා තත්ත්වයට පත් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6057/'15

ගරු රාජීව විජේසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන ජනාධිපතිවරයා සිය ධුරයේ වැඩ භාර ගැනීමෙන් අනතුරුව ආපසු කැඳවන ලද තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් ආපසු කැඳවීමට හේතුව කවරේද;

(iii) ආපසු කැඳවීමට පෙර ඔවුන්ගේ කාර්ය සාධකත්වය පිළිබඳව කිසියම් ඇගයීමක් සිදු කරනු ලැබුවේද;

(iv) මෙලෙස ඇතිවුනු පුරප්පාඩු සංඛ්‍යාව අතරින් මාස තුනක කාලයක් තුළ පුරවනු ලැබූ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත පුරප්පාඩු සඳහා නම් කරන ලද නිලධාරීන්ගේ නම්, ඉහළම අධ්‍යාපන සුදුසුකම්, ජ්‍යෙෂ්ඨත්වය සහ ශ්‍රී ලංකාව තුළ හා විදේශ දූත මණ්ඩලවල සේවා කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී පුරප්පාඩු සඳහා නම් කරන ලද නිලධාරීන් ශ්‍රී ලංකා විදේශ සේවයෙහි සේවා ව්‍යවස්ථාව තුළ නියම කර ඇති අවශ්‍යතාවයන් සපුරාලන පළමු ශ්‍රේණියේ නිලධාරීන් වන්නේද;

(ii) 2015 ජනවාරි මාසය වන විට විදේශ දූත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් ඔවුන් අතර සිටියේද;

(iii) ඉහත කී විදේශ සේවා පුරප්පාඩු සඳහා නම් කරන ලද ලැයිස්තුවේ නම් සඳහන් නොවූ දැනට තානාපතිවරුන් හෝ මහ කොමසාරිස්වරුන් ලෙස සේවය නොකරන සහ එකී ලැයිස්තුවේ සඳහන් යම් කිසි නිලධාරියෙකුට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩි හෝ පළමු ශ්‍රේණියේ නිලධාරීන් සිටින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

6062/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී රේඛීය අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ උතුරු පළාත් අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ අධ්‍යාපන සම්මන්ත්‍රණය පිළිබඳව;

(ii) එම සම්මන්ත්‍රණයේ අරමුණු, සම්මන්ත්‍රණයට වෙන්කළ මුදල්, සම්මන්ත්‍රණයේදි ගනු ලැබූ තීරණ පිළිබඳව;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත අ(ii) හි සඳහන් කරුණුවලට අදාළව ගනු ලැබූ විවිධ ක්‍රියාමාර්ග මොනවාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6074/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දැයට කිරුළ වැඩසටහනට සමගාමීව මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘතීන් මේ වන විට නවතා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) එකී ව්‍යාපෘති නවතා දැමීම හේතුවෙන් රැකියා අහිමි වූ පිරිස කොපමණද;

(iii) ඔවුන්ගේ රැකියා අහිමිවීමේ ගැටලුවට ලබා දෙන විසඳුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5757/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂය තුළ වාර්තා වූ ළමා අපචාර සිදුවීම් සංඛ්‍යාව, ස්ත්‍රී දූෂණ සිදුවීම් සංඛ්‍යාව හා මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත සිදුවීම්වලට වැරදිකරුවන් වූ රාජ්‍ය නිලධාරීන් හා දේශපාලනඥයන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා අනෙකුත් තොරතුරු කවරේද;

(iii) එම නිලධාරීන්ට හා දේශපාලනඥයන්ට ලබාදුන් දඬුවම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ළමා අපචාර, ස්ත්‍රී දූෂණ හා මත්ද්‍රව්‍ය වැරදි සඳහා මෙරට ප්‍රමාණවත් නීති ක්‍රියාත්මක නොවන්නේද;

(ii) එසේ නම්, එම නීති සංශෝධනයට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කෙසේද;

(iv) එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6024/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හිටපු ආරක්ෂක ලේකම්වරුන් අතරින් මේ වන විට වැඩිම ජීවිත අවදානමක් පවතින ලේකම්වරයා කවුරුන්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හිටපු ආරක්ෂක ලේකම්, ගෝඨාභය රාජපක්ෂ මහතා සේවයෙන් ඉවත් වූ පසු ලබා දී තිබූ ආරක්ෂකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම ආරක්ෂකයින්ගේ සංඛ්‍යාව සංශෝධනය කර තිබේද;

(iii) එසේ නම්, දැනට සිටින ආරක්ෂකයින්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පවතින ජීවිත අවදානම මත ගෝඨාභය රාජපක්ෂ මහතාට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දී තිබේද;

(ii) ඒ මහතාගේ ආරක්ෂාවට අදාළ වගකීම රජය භාරගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6055/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමාජසේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සිටින කතා කිරීමට නොහැකි, ශ්‍රවණාබාධිත ජනගහනය කොපමණද;

(ii) ඔවුන් අතරින් රජයේ නිල හැඳුනුම්පත ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රවණාබාධිත අය සඳහා රජය ලබා දී ඇති පහසුකම් කවරේද;

(iv) ශ්‍රවණාබාධිත අය සඳහා සහය ලබා දීමට සිටින භාෂා පරිවර්තකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රවණාබාධිත ප්‍රජාව සඳහා රියදුරු බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

(ii) විකල්ප තාක්ෂණික ක්‍රම භාවිත කර හෝ ඔවුන්ට රියැදුරු බලපත්‍ර ලබා දීමට ඇති හැකියාව පරීක්ෂා කර තිබේද;

(iii) මින් පෙර ශ්‍රවණාබාධිත අය සඳහා රියදුරු බලපත්‍ර ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ශ්‍රවණාබාධිත අයට අධ්‍යාපනය ලබා දීම සඳහා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් සඳහා බඳවා ගෙන ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ශ්‍රවණාබාධිත අයට ඉගැන්වීම සඳහා ශ්‍රවණාබාධිත අය අතරින්, සුදුසුකම් අනුව තෝරාගත් අයට පත්වීම් ලබා දීමට හැකියාවක් තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6063/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) චුන්නාක්කම් හි ක්‍රියාත්මක වන "Northern Power Station" ආයතනය හා ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය ඇතිකරගත් ගිවිසුමක් පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එකී ගිවිසුමට අනුව එම ආයතනය විසින් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට මාසිකව ලබා දිය යුතු විදුලි ඒකක ගණන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට " Northern Power Station" ආයතනය ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(ii) එම ආයතනය අක්‍රියවීම හේතුවෙන් උද්ගත වී ඇති ප්‍රායෝගික ගැටලුවලට විසඳුම් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6075/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට රාජ්‍ය සේවකයින් කොපමණ සංඛ්‍යාවක් සඳහා යතුරු පැදි ලබාදී තිබේද;

(ii) මෙතෙක් යතුරුපැදි ලබාදී නොමැති රජයේ සේවකයන් සඳහා යතුරුපැදි ලබාදීම සිදු කරන්නේද;

(iii) මේ වන විට ඊට අදාළ කටයුතු ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6036/ 15

ගරු රාජීව විජේසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජිනීවාහි ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත තනතුරෙහි සිටි තමරා කුනනායගම් මහත්මිය වර්ෂ 1989 සිට 1990 දක්වා කාල පරිච්ඡේදය තුළ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නියෝජිතවරියක ලෙස කටයුතු කළ බවට "ස්වර්ණවාහිනී" නාලිකාව සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රකාශ කළේද;

(ii) එසේ නම්, එකී ප්‍රකාශය සිදු කරන ලද්දේ කවර සාක්ෂි පදනම් කරගෙනද;

(iii) එකී සාක්ෂි වැදගත්කමකින් යුතුයැයි සළකනු ලබන්නේ නම්, කුනනායගම් මහත්මිය නෙරපීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ(i) හි සඳහන් කාල පරිච්ඡේදය තුළ සහ ඒ ආසන්න කාලයේදී කුනනායගම් මහත්මිය මානව හිමිකම් ක්‍රියාකාරිණියක් වශයෙන් කටයුතු කළ බවත්, ඇය අමාත්‍යවරයා ද සම්බන්ධවී සිටි "මව්වරුන්ගේ පෙරමුණ" නමැති සංවිධානයේ ක්‍රියාකාරකම්වලට සහයෝගය දක්වමින් කටයුතු කළ බවත් එතුමා දන්නෙහිද?

(ඇ) කුනනායගම් මහත්මිය ත්‍රස්තවාදයට අනුකම්පාව දක්වන බවට චෝදනා කිරීමට හේතුව වන්නේ ඇය මානව හිමිකම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී වීමද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

5758/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ වරායේ බ්‍රිතාන්‍ය යුගයේ සිට පැවති දැවැන්ත තාප්පය කඩා ප්ලාස්ටික් ආවරණය සහිත කම්බි දැලක් ගැසීමට කටයුතු කර ඇති බවත්;

(ii) එය වරායේ ආරක්ෂාවට තර්ජනයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් ඉදිකිරීම් වරාය අධිකාරිය විසින් සිදු කරන්නේද;

(ii) එම ඉදිකිරීම් පෞද්ගලික ආයතනයක් විසින් සිදු කරන්නේ නම්, එම ආයතනයේ නම, ලිපිනය, දුරකථන අංකය කවරේද;

(iii) එම සමාගමට එකී කොන්ත්‍රාත්තුව ලබා දීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iv) එම ටෙන්ඩරයේ වටිනාකම කොපමණද;

(v) ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අනෙකුත් සමාගම් කවරේද;

(vi) එම සමාගම් විසින් ඉදිරිපත් කළ ටෙන්ඩර්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2014 වර්ෂයේදී කොළඹ වරායේ ආරක්ෂාව සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) 2015 වර්ෂය සඳහා කොළඹ වරායේ ආරක්ෂාව සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6025/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.12.31 දින වන විට සරත් ෆොන්සේකා මහතාට ලබා දී තිබූ ආරක්ෂකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආරක්ෂකයින් කුමන ඒකකයක් යටතේ ලබා දී තිබුණේද;

(iii) මේ වන විට ඒ මහතාට ලබා දී ඇති ආරක්ෂකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ මහතාගේ ආරක්ෂකයින් සංඛ්‍යාව සංශෝධනය කිරීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) යුද සමයේදී රාජකාරියේ නියුතුව සිට මේ වන විට විශ්‍රාම ගෙන ඇති නාවික හමුදාපති, ගුවන් හමුදාපති, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් හා පොලිස්පති යන තනතුරුධාරීන්ට ලබා දී ඇති ආරක්ෂකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.269/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මගින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.270/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— නකල්ස් රක්ෂිතය ආරක්ෂා කිරීම,— සමස්ත ශ්‍රී ලාංකීය පරිසර පද්ධතියටම බලපෑම් කළ හැකි සංවේදී පරිසර පද්ධතියක් වන නකල්ස් රක්ෂිත වනාන්තරය මේ වන විට මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි තර්ජනයකට ලක්වී ඇති අතර වත්මන් පරපුරට මෙන්ම අනාගත මිනිස් පරපුරට ද මෙම පරිසර විනාශය හේතුවෙන් අවදානමකට මුහුණ පෑමට සිදු වන බැවින්, මිනිස් තර්ජන ඉවත් කර නකල්ස් රක්ෂිතයේ ස්වාධීන පැවැත්ම කඩිනමින් තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.271/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.272/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.273/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— කල් ඉකුත් වූ ඖෂධ භාවිතය නැවැත්වීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළට හා රජයේ රෝහල් තුළ භාවිතයට පැමිණීමේ අවදානමක් ඇති බැවින් රජයේ අදාළ සියලු අංශ මැදිහත්වී ක්‍රියාකාරී සැලසුමක් සකස් කර කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළෙන් ඉවත් කිරීම හා ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.274/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට හඳුනා නොගත් ඒඩ්ස් රෝගීන් 3000 කට ආසන්න ප්‍රමාණයක් සිටින බවට වාර්තා පළ වී ඇති බැවින් ඔවුන් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමටත්, ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමටත් ඵලදායී සුදුසු ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.275/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශයන්හිදී ලිංගික අතවරයට ලක්වන කාන්තාවන්ට සහන සැලසීම,— ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගෘහ සේවයට විදේශ ගතවීමෙන් පසු සිදු වන අතවරයන් හේතුවෙන් සිදුවන ගැබ් ගැනීම් නිසා ශ්‍රී ලාංකීය සමාජය තුළ නිර්මාණය වී ඇති ගැටලු සහගත තත්ත්වයන් සමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරීමට විද්වතුන් හා එම සිදුවීම් හා බැඳුණු පුද්ගල කණ්ඩායම්වලින් සැදුම්ලත් කමිටුවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.276/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත හා අභය භූමිවල ආරක්ෂාව දැඩි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම,— මෑතක සිට ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර සහ අභය භූමි විනාශය වැඩි වෙමින් පවතින අතර ශ්‍රී ලාංකීය පාරිසරික සමතුලිතතාවට ඉන් දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතින බැවින් මෙම විනාශය නැවැත්වීම සඳහා ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සැකසීමට මෙන්ම පවතින නීති ප්‍රතිපාදන විධිමත් හා දැඩි බවකින් යුක්ත වන ලෙස සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.277/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විවිධ ආගමික කණ්ඩායම්වලින් සිදු වන සමාජ බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීම,— ප්‍රධාන ධාරාවේ ආගමික මතවාදයන් විවේචනය කරමින්, එම ආගම්හි අනු කණ්ඩායම් ලෙස තම නිර්වචන හා පැහැදිලි කිරීම් සමාජගත කරන, නව මතවාද ඉදිරිපත් කරමින් එම මතවාද පිළිගත් පුද්ගලයින් එක් රැස් කර ගන්නා, ආගමික හා වෙනත් මුහුණුවරකින් සමාජගත වී ඇති කණ්ඩායම් පිළිබඳ අධ්‍යයනය කරමින් ඔවුන්ගේ මතවාද, ක්‍රියාකාරීත්වයන් හා සමාජයට ඔවුන් නිසා ඇති වන බලපෑම් කවරාකාරද යන්න පිළිබඳ තක්සේරුවක් ලබා දීමට පිළිගත් ආගමික නායකයන්ගෙන් හා විද්වතුන්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කර, වාර්තාවක් කැඳවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.278/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉහළ ප්‍රමිතියෙන් යුත් මැටි භාජන නිෂ්පාදනය කිරීම,— ආහාර පිසීමේදී ගෑස් හා විදුලිය අපතේ නොයන ලෙස ඉක්මනින් තාපය අවශෝෂණය කර ගන්නා මැටි භාජන නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කිරීමට, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට හා මැටි භාජන භාවිතයෙන් සෞඛ්‍යාරක්ෂිතව ආහාර පිසීමට ඇති හැකියාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ජාතික මට්ටමේ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.281/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයට බුදු දහමින් ආභාෂය ලබා ගැනීම,— බුදුන් වහන්සේගේ සිත පිළිබඳ ඇතැම් විග්‍රහයන් නූතන විද්‍යාවට හසු නොවන තරම් ගැඹුරු බැවින්, ඒ පිළිබඳ පර්යේෂණ කිරීමට හා වර්තමානයේ අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ ඇති ගැටලු සඳහා බුදු දහම ඇසුරින් නිර්වචන හා විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති දේශීය හා විදේශීය විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා, ඒ හරහා බුදු දහම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීමටත්, ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ඉහළ නැංවීමටත්, අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.282/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කරවීම,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කිරීම සඳහා මූලික වශයෙන් පාසල් විෂයය නිර්දේශයට එම විෂයය ඇතුළත් කිරීම හා විශ්වවිද්‍යාලවල පුරාවිද්‍යා විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හා පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීමත්, එමගින් පුරාවිද්‍යා විෂයය රට තුළ ව්‍යාප්තවීම හරහා බිහිවන උගතුන්ගෙන් රටට යහපත් සේවයක් ලබා ගැනීමත් අරමුණු කරගත් ජාතික වැඩසටහනක් දිගුකාලීනව සැලසුම් සහිතව නිර්මාණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.285/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ආහාරවල ඇති වස විෂ පිළිබඳ සොයා බැලීමට විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවීම,— කෘෂිකර්මාන්තයේදී භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍ය හේතුවෙන් ආහාර ද්‍රව්‍යයන්ට ද වස විෂ මිශ්‍රවී ඇති අතර, ඒ පිළිබඳව සොයා බැලීමට අදාළ ප්‍රමිති ආයතනයක් දැනට ශ්‍රී ලංකාව තුළ පිහිටුවා නොමැති බැවින් එම කාර්යය සඳහා විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.286/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින් සිඟමනට යොදාගන්නා දරුවන් පුනරුත්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ යාචකයින් දරුවන් සමග සිඟමන් යැදීම තහනම් කර, සිඟමන සඳහා යොදා ගන්නා දරුවන් පුනරුත්ථාපනය කර, ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.306/'15

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීම,— දිනකට දුම්රිය ගමන් වාර 15 ක් පමණ කොළඹ සිට අවිස්සාවේල්ල බලා දිවෙන, දුම්රිය ධාවනයට එක් වී වසර 100 ක් පමණ ගත වී ඇති කැළණිවැලි දුම්රිය මාර්ගය, කොළඹ දිස්ත්‍රික්කයේ සීඝ්‍රයෙන් නාගරීකරණය වන මහරගම, හෝමාගම සහ පාදුක්ක යන ප්‍රදේශ හරහා වැටී ඇති අතර, හයිලෙවල් පාර හා බැඳුනු අතුරු මාර්ග පද්ධති හරහා පෞද්ගලික හා පොදු ප්‍රවාහන සේවාවන් ද භාවිතා කරන මෙම ප්‍රදේශයේ ජනතාව දෛනිකව, උදෑසන හා සවස් කාලයේ දැඩි රථවාහන තදබදයකට මුහුණ දෙන බැවින්, මෙම තත්ත්වයට විකල්පයක් ලෙස මෙම දුම්රිය මාර්ගය පුළුල් කොට සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් දැඩිව මතුවී ඇති අතර දුම්රිය මාර්ගය නවීන, සැහැල්ලු හා විද්‍යුත් දුම්රිය මාර්ගයක් බවට පත් කිරීම හෝ ඉන්ධන පිරිවැය හා කාලය අවම කරන ඉහළින් ගමන් කරන (Monorail) දුම්රිය මාර්ගයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය සැලසුම් කඩිනමින් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2015 ජූනි මස 23 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5759/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාතේ කුරගල ඓතිහාසික පුදබිම තුළ කැනීම් කටයුතු සිදු කිරීම නවතා තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරගල පූජා භූමියට අයත් භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමි ප්‍රමාණයෙහි මායිම් නිර්ණය කර තිබේද;

(iii) කැනීම් මගින් ලබා ගත් පුරා වස්තු රැක ගැනීමට පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කුරගල පූජා භූමියේ බෞද්ධ අයිතිය තහවුරු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එහි කැනීම් අඛණ්ඩව සිදුකිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6026/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් ජනාධිපතිවරයා සහ හිටපු ජනාධිපතිවරුන් අතරින් එල්. ටී. ටී. ඊ. සංවිධානයේ ක්‍රියාකාරකම් හේතුවෙන්, දේශීය හෝ විදේශීය වශයෙන් වැඩිම ජීවිත තර්ජනයකට ලක්ව ඇති අය කවුරුන්ද යන්න බුද්ධි අංශ ඇතුළු වෙනත් තොරතුරු ඇසුරින් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය විශ්‍රාම යන අවස්ථාවේ ලබා දී තිබූ ආරක්ෂකයින් සංඛ්‍යාව සහ මේ වන විට එතුමියගේ ආරක්ෂක ඒකකයට අයත් ආරක්ෂකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තනතුරින් ඉවත්ව යන විට ලබා දී තිබූ ආරක්ෂකයින් සංඛ්‍යාව සහ මේ වන විට ලබා දී ඇති ආරක්ෂකයින්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) හිටපු ජනාධිපතිවරුන්ට ලබා දී තිබූ ආරක්ෂාව අඩු වැඩි කිරීමට අදාළව යොදා ගන්නා නිර්නායක කවරේද;

(iv) ඒ සම්බන්ධයෙන් තීරණ ගනු ලබන අය සහ එකී වගකීම භාරව ඇති අය කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6076/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තනය යටතේ රාජ්‍ය සේවකයින් සඳහා යතුරුපැදි ලබා දීමට අයකළ රු.50,000/=ක මුදල ආපසු ලබා දෙන බවට දින 100 වැඩ සටහනෙහි ඇතුළත් වූ පොරොන්දුවට අනුව, මේ වන විට එම මුදල් ආපසු ගෙවීම ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, මේ වන විට මුදල් ආපසු ගෙවා ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5760/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලේ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) මෙම මුදල වැය කළ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම වැඩ සටහන් මගින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම සඳහා එවකට පැවති තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සිදු කළ කටයුතු කවරේද;

(ii) 2014 වර්ෂයේදී ඉදිරිපත් වූ නව නිපැයුම් කවරේද;

(iii) එම නව නිපැයුම් ඉදිරිපත් කළ පුද්ගලයන් කවුරුන්ද;

(iv) ඔවුන්ට ලබා දුන් අනුග්‍රහයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන මුදල වැඩි කර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, වැඩි කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) එම මුදල වැය කිරීමට ඇති සැලසුම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6027/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 228B තඹලගමුව ග්‍රාම නිලධාරී වසමේ මොල්ලිපොතාන, පැරකුම් පෙදෙස, අංක 05 හි පදිංචි ඊ. කේ. ජී. ජයතිලක පවුල සඳහා රු. 2000/- ක සමෘද්ධි දීමනාවකුත්, එම වසමේ ම මොල්ලිපොතාන, පැරකුම් පෙදෙස, අංක 131 හි පදිංචි සිව්දෙනෙකුගෙන් යුත් යූ. ජී. අනුලාවති පවුල සඳහා රු. 3000/- ක සමෘද්ධි දීමනාවකුත් ලැබිය යුතුව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි දීමනා ලැබිය යුතු වුවද, දැනට ඊ. කේ. ජී. ජයතිලක පවුල සඳහා රු. 1000/- ක දීමනාවක් සහ යූ. ජී. අනුලාවති පවුල සඳහා රු. 2000/-ක දීමනාවක් ලබා දීමට හේතුව කවරේද;

(ii) අනිවාර්ය ඉතුරුම් මුදල හැරුණු විට සත්‍ය වශයෙන්ම මෙකී පවුල් දෙක සඳහා ලැබිය යුතු සමෘද්ධි දීමනාව ඔවුන්ට ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම ගෙවීම ආරම්භ කරන දිනය කවදාද;

(iv) එම දීමනාවට හිඟ මුදල ද එක් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6077/’15

ගරු ටී. බී. ඒකනායක මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතුරු අයවැයේදී 200% කින් වැඩි කළ සමෘද්ධි දීමනා ප්‍රතිලාභ මහජනතාවට ලබා දෙන දිනය කවරේද;

(ii) එම ප්‍රතිලාභ ලබා දීමේදී සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ නම් ලැයිස්තු සංශෝධනය කරන්නේද;

(iii) එසේ නම්, එම සංශෝධන ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සිදු කරන්නේද;

(iv) එම දීමනා පත්‍ර වට්නාකම් සඳහා ප්‍රතිලාභීන් තෝරාගන්නා ක්‍රමවේදයන්/ නිර්ණායකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5761/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට විදේශ රටවල අත් අඩංගුවේ පසු වන ශ්‍රී ලාංකික ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අත් අඩංගුවේ පසුවන රටවල් හා එක් එක් රටේ සිටින ධීවරයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අත් අඩංගුවේ පසුවන එක් එක් ධීවරයාගේ නම, ලිපිනය, දුරකථන අංකය හා අත් අඩංගුවේ සිටි කාල සීමාව වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නේද;

(ඇ) (i) අත් අඩංගුවට පත්වන ධීවරයන් කඩිනමින් මුදා ගැනීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) ධීවරයන් මුහුදු සීමා උල්ලංඝනය කිරීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) අත් අඩංගුවට පත් ධීවරයන් නිදහස් වූ පසු තම රැකියාව නැවත ආරම්භ කිරීම සඳහා සහාය ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6082/’15

ගරු ටී. බී. ඒකනායක මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොරගහකන්ද ජලාශයේ ඉදිකිරීම් අවසන් කිරීමට බලාපොරොත්තු වන කාල සීමාව කවරේද;

(ii) යාපහුව හා ගල්ගමුව ආසන සඳහා මහවැලි ජලය ලබා දීම සඳහා වන සැලසුම අනුව හක්වටුනාව, පීල්ල වේලි මාර්ගවල ඉදිකිරීම් ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරන්නේද;

(iv) පොල්පිතිගම ආරම්භ කළ වාරිමාර්ග කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කරන්නේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා.308/'15

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු කමලා රණතුංග මෙනෙවිය

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු මනුෂ නානායක්කාර මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු ගුණරත්න වීරකෝන් මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු තිස්ස කරල්ලියද්ද මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ගරු ජානක බණ්ඩාර මහතා

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු ඩබ්ලිව්. බී. ඒකනායක මහතා

ගරු ජගත් බාලසූරිය මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු වී. කේ. ඉන්දික මහතා

ගරු විජය දහනායක මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු නිර්මල කොතලාවල මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු කනක හේරත් මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු සරත් කුමාර ගුණරත්න මහතා

ගරු හේමාල් ගුණසේකර මහතා

ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා

ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා

ගරු ලලිත් දිසානායක මහතා

ගරු සී. ඒ. සූරියආරච්චි මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු රුවන් රණතුංග මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා

ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා

ගරු සරණ ගුණවර්ධන මහතා

ගරු වික්ටර් ඇන්ටනි මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු ජයසිංහ බණ්ඩාර මහතා

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ටිරාන් අලස් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා

ගරු පී. පියසේන මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා,— මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතාට එරෙහි විශ්වාස භංගත්වය,—

ද්‍රවිඩ පුනරුත්ථාපන සංවිධානයට (TRO) ප්‍රවර්තන මූල්‍ය සම්පාදකයෙකු වූ ද, මූල්‍යමය අපරාධ සම්බන්ධයෙන් දඬුවම් ලැබ දැනට ඇමෙරිකා එක්සත් ජනපදයෙහි බන්ධනාගාරගතව සිටින්නා වූ ද, රාජ් රාජරත්නම් මහතා සමග විනිමය ගනුදෙනු සම්බන්ධතාවන් පැවැත්වූ ගරු රවි කරුණානායක මහතාට ඉහළ විශ්වාසනීය ගරු තනතුරක් වන මුදල් අමාත්‍යධූරයේ වගකීම් භාර ගැනීමට සදාචාරාත්මක අයිතියක් නොමැති හෙයින් ද,

ගරු රවි කරුණානායක මහතා,

පසුගිය රාජ්‍ය පාලන යුගයේදී, රටේ නිමැවුම, ආදායම, සේවා නියුක්තිය, මිල මට්ටම, ගෙවුම් ශේෂය, ඉතුරුම්, ආයෝජනය වැනි සාර්ව ආර්ථික විචල්‍යයන් කෙරෙහි බරපතළ හානිකර බලපෑම් ඇති කොට, සමස්ත ආර්ථිකයම මුළුමනින්ම විනාශ කොට ඇති බවට පාර්ලිමේන්තුවේදී අසත්‍ය සහ ද්වේශ සහගත ප්‍රකාශයන් කිරීම තුළින් පාර්ලිමේන්තුව හා රටේ ජනතාව නොමග යවමින් ස්වකීය පටු දේශපාලන අරමුණු ඉටුකර ගැනීමට ප්‍රයත්න දරන හෙයින් ද;

රාජ් රාජරත්නම් මහතා ද, ශ්‍රී ලංකාවේ ආයෝජන සඳහා පෙළඹ වූ ගජ මිතුරු සමාජයේ සාමාජිකයෙකු වූ සිංගප්පූරුවේ පුරවැසි අර්ජුන මහේන්ද්‍ර මහතාගේ උපදේශකත්වයෙන් හා මෙහෙයවීමෙන් ශ්‍රී ලංකා මහ බැංකු ඉතිහාසයේ සිදු වූ විශාලතම භාණ්ඩාගාර බැඳුම්කර වංචාව පිළිබඳ පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමටත් ප්‍රථම මහ බැංකු අධිපතිවරයා නිදොස් අයෙකු බවත්, බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රියාවලිය නිවැරදි විනිවිදභාවයකින් කර ඇති බවටත් ප්‍රසිද්ධ ප්‍රකාශ කිරීමෙන් මූල්‍ය වෙළෙඳපොළ නොමග යැවීමට උත්සාහ දරා ඇති හෙයින් ද;

ඉතා විශ්වාසනීය ලෙස ජාත්‍යන්තර සම්මතයන්ට අනුව පිළියෙළ කරන ලද මහ බැංකු වාර්තා සහ සංඛ්‍යා දත්ත විශ්ලේෂණ වැරදි සහගත පිළිගත නොහැකි ඒවා බවට මුදල් අමාත්‍යවරයා ලෙස පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතදීත් ප්‍රකාශ කිරීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව අපකීර්තියට පත් වන අයුරින් ක්‍රියා කර ඇති හෙයින් ද;

භාණ්ඩාගාර බිල්පත් අනුමත සීමාව රුපියල් කෝටි 40,000 කින් ඉහළ නැංවීමේ යෝජනාවේදී පාර්ලිමේන්තුව නොමග යවන අත්තනෝමතික ප්‍රකාශයන් සිදු කිරීම හේතුකොට ගෙන එකී මුදල් රෙගුලාසිය උත්තරීතර සභාවේ බහුතර ඡන්දයෙන් පරාජය වූ අතර, ස්වකීය මුදල් රෙගුලාසිවත් මෙම ගරු සභාවේ සම්මත කරගැනීමට ප්‍රමාණවත් යහ පැවැත්මක් සහ සහජීවනයක් ප්‍රදර්ශනය කිරීමට මුදල් අමාත්‍යවරයා අපොහොසත් වන හෙයින් ද;

මුදල් අමාත්‍යවරයාගේ වගකීම් රහිත ක්‍රියාකලාපයන් හා බලපරාක්‍රමයන් විහිදුවාලීම නිසාවෙන් මුදල් වෙළෙඳපොළ, ප්‍රාග්ධන වෙළෙඳපොළ, ණය වෙළෙඳපොළ, කොටස් වෙළෙඳපොළ සහ ආයෝජන වෙළෙඳපොළට තක්සේරු කළ නොහැකි අලාභයන් සිදුවී ඇති හෙයින් ද, එකී වෙළෙඳපොළවල්හි වෘත්තිකයන්ට සහ සහභාගීකරුවන්ට තර්ජනාත්මක බලපෑම් සිදු කරන බවට වාර්තා වී ඇති හෙයින් ද;

රටේ පොලී අනුපාතිකය, විනිමය අනුපාතිකය සහ විදේශ විනිමය සංචිත යනාදී ඉතා වැදගත් සාර්ව ආර්ථික සාධකයන් කෙරෙහි අහිතකර බලපෑම් ඇති කිරීමට මුදල් අමාත්‍යවරයාගේ ක්‍රියාකලාපයන් හේතු වී ඇති හෙයින් ද;

දේශපාලන වාසි පමණක් අරමුණු කොට ගෙන කෙටි කාලීනව මහජනතාව අතර ජනප්‍රිය විය හැකි, එහෙත් මැදි කාලීන හා දිගු කාලීන වශයෙන් පොදු ජනතාව මත අධික පීඩනයක් පැටවෙන මූල්‍ය ක්‍රියා පිළිවෙත් අනුගමනය කිරීමට වැරදි උපදෙස් ලබාදීමෙන් හා ඒවා ක්‍රියාත්මක කිරීමට යත්න දැරීමෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ විධිවිධාන උල්ලංඝනය කර ඇති හෙයින් ද;

දේශීය හා විදේශීය ආයෝජකයන්ගේ විශ්වාස බිඳ වැට්ටවීමට හා පෞද්ගලික ආයෝජන අධෛර්යමත් කරන අයුරින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීම සිදු කරන හෙයින්ද;

රාජ්‍ය බදු අය කිරීමේ මූලධර්මවලට පටහැනි වන අයුරින් වෛරී බදු වර්ග පැනවීම තුළින් රාජ්‍ය මූල්‍ය කටයුතු හරහා ඇතැම් සාධාරණ යහපාලන ව්‍යවසායකයන් පවා පීඩාවට පත්ව ඇති හෙයින් ද;

අයහපත් මූල්‍ය කළමනාකරණයේ ඍජු ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය පිරිවැය ඉහළ නැංවීමෙන් බදු ගෙවන පොදු ජනතාව මත රුපියල් කෝටි ප්‍රකෝටි පොලී හා ණය බරක් උරුම කිරීමට අතිරේකව, ජාත්‍යන්තර මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළෙහි විශ්වාසනීයභාවය පළුදු කර ගැනීම

නිසාවෙන් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර වැනි වාසිදායක මූල්‍ය මාර්ගයන්ගෙන් රජයට මූල්‍ය සම්පත් සපයා ගැනීමට තිබූ ඉඩ ප්‍රස්ථා අහිමි කොට ඇති හෙයින් ද;

2015 වර්ෂය තුළ දී අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉලක්කයන් කරා ළඟා විය නොහැකි වීමෙන් ආර්ථිකයට පසුගාමී වර්ධනයක් උරුම වීම හේතුවෙන් වර්ෂ අවසානයේදී සමස්ත ශ්‍රී ලාංකීය ජනතාව සුවිශාල පීඩනයකට නතු කරන ආර්ථික අගාධයක් නිර්මාණය කෙරෙමින් පවත්නා හෙයින් ද;

2015 අයවැය ඇස්තමේන්තුව (සංශෝධිත) කෙටුම්පත මගින් වී ගොවීන්ට, තේ සහ රබර් නිෂ්පාදකයන්ට සහ වෙනත් ආයතන, සංවිධාන හා කුටුම්භයන් වෙතට ලබාදෙන බවට දිවුරා සපථ කළ පොරොන්දු ඉටු නොකළ බැවින් ද;

අධ්‍යාපනය සඳහා රාජ්‍ය අයවැයෙන් 6%ක් වෙන් කරන බව ප්‍රකාශ කරමින් 2015 අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කළ මුදල් සුවිශාල ලෙස කප්පාදු කරමින් මහින්දෝදය ද්විතීක පාසල් දහසේ වැඩසටහන, තාක්ෂණික විෂය ධාරාවේ යටිතල පහසුකම්, විද්‍යා පීඨ හා පිරිවෙන්වල යටිතල පහසුකම් වැනි ව්‍යාපෘති සම්පූර්ණයෙන් නතරවීමෙන් ශ්‍රී ලාංකීය නිදහස් අධ්‍යාපනය විනාශ කිරීමට අනුබල දී ඇති හෙයින් ද;

රජය ආර්ථිකය තුළ සංවර්ධන කාර්යයන් සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියා කිරීමට උනන්දු නොවීමෙන් ශ්‍රී ලංකාවේ සුළු, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ පුද්ගලික අංශ බරපතළ ලෙස පීඩාවට පත් වීමෙන් ඒවායේ රැකියා කරමින් සිටි පුද්ගලයින් රැකියා නොමැති වූවන්ගේ ගොඩට ඇද දමා ඇති හෙයින් ද;

ජාතියේත්, ජාතික ආර්ථිකයේත්, පොදු ජනතාවගේත් යහපතට අදාළ වන පරිද්දෙන් මූල්‍ය කළමනාකරණය කිරීමට මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතාට ඇති හැකියාව පිළිබඳ විශ්වාසය බිඳ වැටී ඇතැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.